# රබර් වගාව සහ
# ඊට අදාල කරුණු පුහුණු කිරීමේ පන්ති

ආර්. පී. එම්. ද සොයිසා විසිනි
(උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධානියා.)

රබර් වගාවට ශ්‍රී ලංකා ආර්ථිකයේ හිමිවන්නේ ඉතා වැදගත් තැනකි. දැනට ශ්‍රී ලංකාවේ අක්කර හය ලක්ෂයක පමණ බිම් ප්‍රමාණයක රබර් වගා කර ඇත. මෙම බිම් ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණ කුඩා රබර් වතු හිමියන් සතුය. කුඩා රබර් වතු හිමියන්ට තමන්ගේ ඉඩම් වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීම සඳහාත්, රබර් නිෂ්පාදනයන්ගෙන් වැඩි ආර්ථික වාසියක් සළසා ගැනීම සඳහාත් ඔවුන් අතර රබර් වගාව ගැන අවබෝධයක් මෙන්ම, එය දියුණු කර ගැනීමේ ලා සැහෙන ආශාවක්ද ඇති විය යුතුය. එහෙත් පොදුවේ බලන කල, කුඩා ඉඩම් හිමියන් අතර රබර් වගාව පිළිබඳ ක්‍රමානුකූල දැනීමක් නොමැති බව පෙනේ. මෙය කුඩා ඉඩම් හිමියන්ට පෞද්ගලිකවත්, රටේ ආර්ථිකයට පොදු වශයෙනුත්, අයහපත් ලෙය බලපාන කරුණකි. එමනිසා රබර් වගාවෙන් වැඩි ආර්ථික වාසියක් ලබා ගැනීම සඳහා ඒ පිළිබඳව ක්‍රමානුකූල අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත්ය.

## පුහුණුවීමේ පන්ති:

රබර් ගසින් නියම ප්‍රයෝජනය ලබා ගැනීම පිළිබඳව කුඩා ඉඩම් හිමියන් පුහුණු කිරීමේ පාඨමාලාවක් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයෙහි උපදේශක සේවා දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද්දේ මේ තත්ත්වයට පිළියමක් යෙදීමේ අරමුණ ඇතිවය. 1961 වර්ෂයේදී කිරි කැපීම පුහුණු කිරීමේ පන්ති යනුවෙන් කුඩා ඉඩම් හිමියන් සඳහා ඇරඹුණ මෙම පාඨමාලාව අද හැම රබර් උපදේශක කොට්ඨාශයකම වාගේ පවත්වාගෙන යයි, දැනට මෙම පන්ති 24 ක් පැවැත්වේ. මෙම පුහුණු කිරීමේ පන්ති වලින් මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ තමන් සතු කුඩා රබර් ඉඩම ක්‍රමානුකූලව සකස් කර ගැනීම හා රබර් ගසෙන් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීම පිළිබඳව අවශ්‍ය වන සැම කරුණක් ගැනම අවබෝධයක් ලබා දීමයි. මෙම දැනුම, රබර් පැළ සිටුවීමේ සිට , ගසෙන් වැඩි ආදයමක් ලබා ගැනීම දක්වා පැතිර පවතී. පැල සිටුවීම, කානු කැපීම, ආවරණ වගා, පස් සංරක්ෂණය, පොහොර යෙදීම, නිසිකල එළඹුන විට කිරි කැපීම, කිරි කැපීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග, ගසට වැළඳෙන රෝග,සහ ඒවා වැළැක්වීම, උසස් වර්ගයේ ෂීට් නිපදවීම, ආදී රබර් වගා කරන්නෙකු විසින් අත්‍යාවශ්‍යයෙන්ම දැනගත යුතු විද්‍යානුකූල කරුනු රැසක් පිළිබඳව පැහැදිළි අවබෝධයක් ලබා දීමට මින් කටයුතු සලසා ඇත.

## ඔබ කළ යුතු දේ:

මෙම පන්ති වයස් සීමාවකින් තොරව පොදුවේ කුඩා ඉඩම් හිමියන්ට විවෘතව ඇතත්, වයස 18 – 45 අතර අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. නමුත් තමා සතු කුඩා ඉඩමක් හිමි, තමා විසින්ම කිරි කපන කුඩා ඉඩම් හිමියෙක් වීම හෝ තම නෑයෙකුගේ කුඩා රබර් ඉඩමක වැඩ කරන්නෙකු වීම හෝ එසේත් නැති නම කුඩා ඉඩම් හිමියන් විසින් සේවයට ගෙන ඇති කිරි කපන්නෙකු වීම මේ පන්තිවලට සහභාගිවීමේ සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ. එයට අමතරව නව අධ්‍යාපන ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි ප්‍රාග් වෘත්තීය විෂයයක් වශයෙන් පාසැල් යන ළමුන්ටද මෙම පාඨමාලාව හැදෑරීමට කටයුතු සලසා ඇත.

සාමාන්‍යයෙන් මෙම පන්ති පවත්වනු ලබන්නේ ගොවිතැන් කටයුතු වල යෙදී සිටින කුඩා ඉඩම් හිමියන්ට පහසු වන පරිදි සවස් කාලයේදීය. සාමාන්‍යයෙන් එක් පන්තියක් දිනකට පැය 2½ ක පමණ කාලයක පැවැත්වේ. මෙම පන්ති වලට සහභාගි වන්නන්ගේ ප්‍රවීනත්වය මැන ගැනීම සඳහා පාඨමාලාව අවසානයේදී වාචික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්ෂණයේදී සතුටුදායක ප්‍රවීනත්වයක් දක්වන අයට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් සහතික පත් නිකුත් කරනු ලැබේ. සැම දිනකම වාගේ පන්ති වලට පැමිණි අය පමණක් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුස්සන් වෙති.

පළාතේ රබර් උපදේශක තැනගේ මූලිකත්වය යටතේ මේ පන්ති පවත්වනු ලැබේ. මේ පන්ති වලින් ඔබට රබර් වගාව පිළිබඳ ක්‍රමානුකූල දැනුමක්, ප්‍රයෝගික වශයෙන්ද ලබා ගැනීමට හැකිවෙනවා ඇත. සාමාන්‍යයෙන් මේ පන්ති ඇරඹෙන්නේ වර්ෂයේ ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවලදීය.

රබර් වගාව පිළිබඳ ඔබ නොදන්නා කරුනු රැසක් ඔබට මේ පන්ති වලින් දැනගැනීමට හැකි වනු ඇත. එමෙන්ම රබර් වගා කර ඇති ඔබගේ කුඩා ඉඩම වැඩි දියුණු කර ගැනීමටත්, වෙනදට වඩා වැඩි ආදායමක් ලබා ගැනීමටත් ඉන් මගක් සැලසෙනවාක් මෙන්ම, ශ්‍රී ලංකා ආර්ථිකයේ රබර් වගාවට හොඳ කලක්ද උදවනු නිසැකය. කුඩා ඉඩම් හිමියකු වන ඔබටත් ඉතාමත් පහසුවෙන් මෙම පන්ති වලට සහභාගි වීමට පුළුවන.

ඔබත් මෙවැනි පන්තියක් පිහිටුවීමට අදහස් කරන්නේ නම්, ඔබ කළ යුත්තේ 25 පමණ සාමාජිකයන් පිරිසක් එකතු වී ඔබ ප්‍රදේශයේ රබර් උපදේශක තැනගෙන් හෝ ප්‍රාදේශීය උප-දේශක නිලධාරී තැනගෙන් හෝ රත්මලාන, තෙලවල පාරේ පිහිටි උපදේශක සේවා දෙපාර්-තමේන්තුවේ ප්‍රධාන නිලධාරි තැනගෙන් හෝ විමසීමයි. එවිට ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ අනෙකුත් අවශ්‍ය සහයෝගයත් ඔබට නොපමාව ලැබෙනවා ඇත.

---